# හිමිකම් රක්ෂණ අරමුදල

உரிமைகள் காப்புறுதி நிதியம்

# Title Insurance Fund



## කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2022

## செயலுகை அறிக்கை மற்றும் கணக்குகள் - 2022

## Performance Report & Accounts - 2022

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாய்கம் திணைக்களம்

Registrar General's Department

# හිමිකම් රක්ෂණ අරමුදල

## කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2022



## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

# පටුන


- කාර්ය සාධන වාර්තාව හා ගිණුම් (සිංහල)
- செயலாற்றுகை (செயல் இலக்கு) அறிக்கை மற்றும் கணக்குகள் (தமிழ்)
- Performance Report & Accounts (English)
- හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපතිතුමාගේ පණිවිඩය
- හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්තුමියගේ පණිවිඩය

01. හිමිකම් රක්ෂණ අරමුදල

1.1 හැඳින්වීම

1.2 දැක්ම,මෙහෙවර,අරමුණ

1.3 පනත් හා රෙගුලාසි

1.4 ව්‍යුහය

02. කළමනාකරණ මණ්ඩලය

2.1 කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

2.2 කළමනාකරණ මණ්ඩල රැස්වීම්

2.3 කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන්

2.4 ලබාගෙන ඇති තීරණ

03. ප්‍රගතිය

3.1 හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම

3.2 භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම

3.3 කාර්ය සාධනය

3.4 වන්දි ගෙවීම

04. මූල්‍ය වාර්තා

4.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

4.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

4.4 ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

4.5 ශේෂ පිරික්සුම

4.6 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

05. විගණකාධිපතිගේ වාර්තාව

# හිමිකම් රක්ෂණ අරමුදලේ වත්මන් සභාපතිතුමාගේ පණිවිඩය

ප්‍රෞඩ ඉතිහාසඝකට උරුමකම් කියන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට ඇත්තේ වර්ෂ 1864 ජනවාරි මස දීය. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවෙන් සලසනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය මංපෙත් එළිපෙහෙළි කරමින් ඉදිරියට ගමන් කරමින් සිටී. මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළ මුල් අවධියේ ප්‍රමුඛතම කර්තව්‍ය වූයේ ලේඛන ලියාපදිංචි කිරීම වුව ද පසුකාලීනව එනම් වර්ෂ 1867 දී පටන් ශ්‍රී ලාංකීය මහජනතාවගේ සිවිල් අයිතීන් වන විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කර ඇත.

ඒ අතරින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වෙමින් ඉඩමේ නිරවුල් අයිතිය වෙනුවෙන් වඩා සුරක්ෂිත සහතිකපතක් මහජනතාව වෙත නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. මේ වන විට දිවයින පුරා ඉඩම් කාර්යාල 30ක ස්ථාපිත කර ඇති හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ඉමහත් සේවයක් සපයමින් සාර්ථකව ක්‍රියාත්මක වේ.

මෙහිදී හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධි විධාන අනුව යමින්, ඉඩම් හිමිකරුගේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට අධිකරණ නියෝග මත වන්දි ගෙවීම සඳහා මෙවැනි හිමිකම් රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබීම ප්‍රසංශනීයයි. අරමුදලේ ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම 2010 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට යෙදුණි. නීති රෙගුලාසි අනුව ක්‍රියාත්මක වෙමින්, හිමිකම් රක්ෂණ අරමුදලේ මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. 2022 වර්ෂය අවසාන වන විට සමුච්චිත අරමුදල මිලියන 138 ඉක්මවා ඇත.

කුමන තත්ත්වයක් මතදී වුවද රක්ෂණ මණ්ඩලයේ කටයුතු 2022 වසර තුලදී ද අඛණ්ඩව ඉටු කිරීමට හැකි වීම පිළිබඳ කළමනාකරණ මණ්ඩලයට මෙන්ම කාර්ය මණ්ඩලයට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි. මෙම කාර්යභාර්ය නිසි පරිදි ඉටු කිරීමට විෂයභාර අමාත්‍යාංශයෙන් ලැබුණු මඟපෙන්වීම හා උපදේශකත්වය බෙහෙවින් අගය කරමි. අවසාන වශයෙන් වඩාත් විශ්වාසදායී සුරක්ෂිත හිමිකමක් පුරවැසියන් වෙත ලබාදෙනු වස් මෙහි කටයුතු සඳහා ඉදිරියටත් සක්‍රීය දායකත්වය ලබාදීමට අපේක්ෂා කරමි.

**ඩබ්.ආර්.ඒ.එන්.එස්.විජයසිංහ**

**රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ සභාපති**

# හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්තුමියගේ පණිවිඩය

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධික්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කළයුතු හිමිකම් රක්ෂණ අරමුදල මඟින් නිශ්චිත දේපලවලට අදාලව නීත්‍යානුකූල හිමිකමේ අයිතිය, රජයේ වගකීමක් සහිතව ලියාපදිංචි කිරීමේදී සිදුවිය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවීමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදු වන හානිය සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් මත වන්දි ප්‍රධානය කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව එම දේපලවලට අදාල ලේඛන සංරක්ෂණය කිරීමෙන් ද එම ලේඛනවලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන් ද ඉඩමේ අයිතිය රැක ගැනීම පිණිස මහජනතාවට සහාය වීම අපගේ කාර්යභාර්යයි.

හිමිකම් සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව සිදුවන ගණුදෙනු ලියාපදිංචි කිරීම තුලින් ලැබෙන ආදායමෙන් 40% ක මුදලක් හිමිකම් රක්ෂණ අරමුදල සඳහා බැරවන අතර එයින් පරිපාලන වියදම් හැර ඉතිරිය අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි අනුව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලබයි.

හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධව පවත්වනු ලබන බිම්සවිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී මෙම රක්ෂණ අරමුදල පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන අතර ඉදිරියේදීත් මේ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙමින් කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරමින් රක්ෂණ අරමුදලේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට මේ වන විට කටයුතු කරගෙන යන අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට ද මග පෙන්වීම හා උපදේශකත්වය ලබාදීම වෙනුවෙන් රක්ෂණ අරමුදලේ සභාපති රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට ද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදලේ කළමනාකරණ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සමඟ හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහාය වීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීමට ඉදිරියටත් අපේක්ෂා කරමි.

**ජේ.ඒ.එස්.කේ.කරුණාරත්න**

**සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් / හිමිකම් රක්ෂණ අරමුදලේ ලේකම්**

# 01.හිමිකම් රක්ෂණ අරමුදල

## 1.1 හැඳින්වීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඉඩම් මැන නිරවුල් කර, හිමිකම ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කර අදාල පාර්ශවකරුවන් වෙත හිමිකම් සහතික ලබාදීම සිදුකරගෙන යනු ලැබේ. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 30ක හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු දැනටමත් සිදු කරගෙන යනු ලබයි. පෙර සඳහන් පනතේ විධිවිධාන අනුව ඉඩම් අයිතිකරුගේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් පාර්ශවකරුවන්ට වන හානිය වැළැක්වීම සඳහා හෝ කිසියම් වෙනත් හේතුවක් මත ඉඩම් අයිතිකරුවන්ට වන හානියට වන්දියක් ලෙස කිසියම් මුදලක් අධිකරණ නියෝගයක් මත ප්‍රතිපූර්ණය කිරීමට පනතේ ඉඩකඩ සලසා ඇත.

ඒ අනුව 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62(1) වගන්තිය පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළමනාකරණය කළයුතු හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා සහ ඉඩම් අමාත්‍යවරයා විසින් 2003 ජුනි මස ඉදිරිපත් කරන ලද පොදු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2003.10.08 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර රක්ෂණ අරමුදලට අදාල නියෝග අංක 1616/23 හා 2009 .08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇත. එකී රෙගුලාසිවලට අනුව හිමිකම් රක්ෂණ අරමුදල සඳහා 2009 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලයක් පත්කර ඇති අතර 2010.02.23 වන දින ප්‍රථම කළමනාකරණ මණ්ඩල රැස්වීම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී පවත්වා ඇත.

හිමිකම් රක්ෂණ අරමුදලේ බැංකු ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද බැංකුවක ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව ලංකා බැංකුව බත්තරමුල්ල ශාඛාවේ අදාල ගිණුම ආරම්භ කර ඇත. මෙම අරමුදලට මුදල් එකතු වන්නේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාල පසු ගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු වලිනි. රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් වූ නියෝග ඇතුලත් අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය පරිදි මාසය තුල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු ආදායමින් 40% ක් රක්ෂණ අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර එම මුදලින් 25%ක් අරමුදලේ පරිපාලන වියදම් දැරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට ගෙවනු ලැබිය යුතුය.

එකී ගැසට් පත්‍ර යේ සඳහන් පරිදි රක්ෂණ අරමුදලේ මුදල්වලින් හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු අතර 2022 වර්ෂය අවසාන වන විට එසේ ආයෝජනය කරන ලද හිමිකම් රක්ෂණ අරමුදලේ මුළු සමුච්චිත අරමුදල රු.138,326,029.54 ක් වේ.

## 1.2 දැක්ම

හිමිකමේ අයිතිය ලියාපදිංචිය තුලින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතාවට සහය වීම.

## මෙහෙවර

නිශ්චිත දේපලවලට අදාලව නීත්‍යානුකූල හිමිකමේ අයිතිය, රජයේ වගකීමක් සහිතව ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවීමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් වන්දි ප්‍රධානය කිරීම හා එම දේපලවලට අදාල ලේඛණ සංරක්ෂණය කිරීමෙන්ද එම ලේඛණ වලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන්ද ඉඩමේ අයිතිය රැක ගැනීම පිණිස මහජනතාවට සහාය වීම.

## අරමුණු

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු මඟින් සිදුවන ගණුදෙනු ලේඛනගත කිරීම වෙනුවට ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. මෙම අයිතිය ලියාපදිංචි කිරීමේදී සිදු විය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවීමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තීරණයක් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් රජය වගකීමට බැඳෙන අතර, ඒ අනුව සිදුවන අලාභය වෙනුවට වන්දි ප්‍රදානය කිරීමට මෙම පනතේ විධිවිධාන සළසා ඇත. මෙම අරමුණු ඇතිව හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවන ලදී. මෙම හානිපූර්ණය කිරීමේදී පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමුවිය යුතු අතර අධිකරණය මඟින් දෙනු ලබන තීන්දුවක් මඟින් අදාල පාර්ශවවලට ගෙවිය යුතු වන්දි මුදල තීරණය කරනු ලැබේ.

## 1.3 පනත් හා රෙගුලාසි

- **1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

- **අංක 1616/23 හා 2009.08.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය**

# 1.4 ව්‍යුහය

## කළමනාකරණ මණ්ඩලය

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් සභාපති විය යුතුය
- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්
- ඉඩම් විෂය භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;
- මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ නියෝජිතයෙක් ; සහ
- ප්‍රධාන තක්සේරුකරු

## කාර්යය මණ්ඩලය

- හිමිකම් අංශය - සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හිමිකම්) - ලේකම්

  කළ.සේවා නිලධාරී (ආයතන කටයුතු)
- මුදල් අංශය - ප්‍රධාන ගණකාධිකාරී - මූල්‍ය කටයුතු

  කළ.සේවා නිලධාරී (ආදායම් සම්බන්ධ කටයුතු)

  කළ.සේවා නිලධාරී (මුදල් පොත හා ගෙවීම් සම්බන්ධ කටයුතු)

  කළ.සේවා නිලධාරී (ගිණුම් කටයුතු)
- අභ්‍යන්තර විගණන අංශය - ප්‍රධාන අභ්‍යන්තර විගණක ( විගණන කටයුතු)

  කළ.සේවා නිලධාරී (විගණන කටයුතු සඳහා සහාය වීම)

# 02. කළමනාකරණ මණ්ඩලය

## 2.1 2022 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් (සභාපති) - පී.එස්.පී.අබේවර්ධන මයා
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන මූල්‍ය නිලධාරී, ස්වදේශ කටයුතු අංශය - ආර්.ජේ.විමලවීර මයා
- ඉඩම් අමාත්‍යාංශයේ නියෝජිත,
  ප්‍රධාන ගණකාධිකාරී, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - ඊ.එල්.ඒ.පී.කුමාර මයා
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිත,
  නීති නිලධාරී, නීති කටයුතු දෙපාර්තමේන්තුව - ඊ.ඒ.පී.දේවිකා මිය
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත,
  අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ඒ.ජී.යූ.නිලකරත්න මයා
- ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව - පී.ඩී.ඩී.එස්.මුතුකුමාරණ මිය

## 2.2 කළමනාකරණ මණ්ඩල රැස්වීම්

- වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවශ්‍යයයි මණ්ඩලයේ සාමාජිකයන් විසින් සළකනු ලබන කවර හෝ අවස්ථාවකදී මණ්ඩලය රැස්විය යුතු අතර, අවම වශයෙන් අර්ධ වාර්ෂිකව ජනවාරි මස සහ ජූලි මාසවලදී මණ්ඩලය රැස්විය යුතු ය.
- සෑම වර්ෂයකම ජනවාරි මාසයේදී මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය.
- මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතුය.
- මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් මණ්ඩලයේ සෑම රැස්වීමකදීම ඔහු මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් අතරින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයෙකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

## 2.3 කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන්

(අ) සමස්ථ වශයෙන් අරමුදලේ කළමනාකාරිත්වය සහ පරිපාලනය සඳහා වගකීම.

(ආ) පනතේ විධිවිධාන ප්‍රකාරව හානි පූර්ණය සඳහා වූ හිමිකම්පෑමක් සාධාරණද නැද්ද, යන්න පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය සහ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එහි කාර්ය පටිපාටිය පාලනය කරන නීති සහ මාර්ගෝපදේශ සෑදීම සහ අනුගමනය කිරීම.

(ඈ) හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑම් විමර්ශනය කිරීම සහ මේ පනත යටතේ හානිපූර්ණය ගෙවීමට අදාල වනුයේ යම් තැනැත්තකුගේ සාවද්‍යතාවය ද, එම තැනැත්තන් හඳුනාගැනීම සහ අරමුදලේ යථා තත්ත්වයට පත්කිරීම සඳහා එම තැනැත්තන්ගෙන් අයකරගත යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම

(ඉ) (ඈ) ඡේදය යටතේ අරමුදලට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔහුට උපදෙස් දීම.

(ඊ) අරමුදලේ ගිණුම්වලට අදාල වාර්තා සහ අරමුදල ක්‍රියාත්මක වීම පිළිගත් ප්‍රමිතිවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේද යන්න විමර්ශනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම.

(උ) මණ්ඩලය විසින් කටයුතු කරනු ලබන සියලු කාරණාවලට අදාල වූ වාර්තාවල නිරවද්‍යතාවය, අංගසම්පූර්ණ බව සහ ආරක්ෂාව පිළිබඳ සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම.

(ඌ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සහ මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.

(එ) අරමුදල මුදල් ලැබීම සහ අරමුදලින් මුදල් පිටතට යෑම පිළිබඳව නීතිපතා සමාලෝචනය කිරීම සහ යම් අහිතකර අවස්ථාවන් නිවැරදි කිරීම සඳහා උචිත පියවර ගැනීම.

(ඒ) වාර්ෂික ඇස්තමේන්තුගත පරිපාලනමය වියදම් සමාලෝචනය කිරීමෙන් පසු සහ අවශ්‍ය නම් ප්‍රතිශෝධනය කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම.

## 2.4 කළමනාකරණ මණ්ඩලය විසින් ලබාගෙන ඇති තීරණ

- රක්ෂණ අරමුදලේ ලේකම් ලෙස සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්(හිමිකම්) තනතුරේ කටයුතු කරන තැනැත්තා පත්කළ යුතුය.

- නිත්‍ය තනතුරු ඇතිකරන තෙක් අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ රාජකාරී ඉටුකරනු ලබන තැනැත්තා විසින් ඉටුකළ යුතුය.

- අරමුදලේ කටයුතු සඳහා ගිණුම් අංශයේ කළමනාකරණ සේවයේ නිලධාරීන් තිදෙනෙකු හා හිමිකම් අංශයේ කළමනාකරණ සේවයේ එක් නිලධාරියෙක් හෝ රෙජිස්ට්‍රාර් සේවයේ එක් නිලධාරියෙකු පත් කළ යුතුය.

- ඉහත සියලු පත්කිරීම් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත සිදු විය යුතුය.

- අරමුදලේ මුදල් ආයෝජනය කිරීම භාණ්ඩාගාර බැඳුම්කරවල/බිල්පත්වල කළ යුතුය.

- සෑම ආයෝජනයකදීම රජයේ බැංකු 3ක මිල කැඳවීම් ලබාගැනීමෙන් පසුව උපරිම ප්‍රතිලාභ හිමිවන භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත්වල ආයෝජනය කළයුතුය.
- ඒ සඳහා කළමනාකරණ මණ්ඩලය නියෝජනය කරන මහ බැංකුවේ නියෝජිතගේ ලිඛිත /වාචික එකඟතාවය ලබා ගැනීම සුදුසුය.

- ගණකාධිකාරී / ලේකම් අනුමැතිය මත Repo ක්‍රමයට ආයෝජනය කිරීම සඳහා උපරිම කාලය මාස තුනක් විය යුතුය.

- මාස තුනකට වැඩි Repo ක්‍රමයට ආයෝජනය සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට අනුමැතිය ලබාදිය හැකිය

- හිමිකම් පනත යටතේ අයකරනු ලබන ගාස්තුවලින් 60%ක් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

- මාසය තුල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණු ආදායමින් 40% ක් ඔහු විසින් ඊළඟ මාසයේ දහවෙනිදාට පෙර රක්ෂණ අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

- වියදම් පියවීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට හිමිකම් රක්ෂණ අරමුදලේ ගිණුමට ගෙවන ලද ගාස්තුවලින් සියයට විසිපහක් (25%) මාරු නොකර **සත්‍ය වියදම පමණක්** මාරු කිරීම කළ යුතුය.

- හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට පාර්ශවකරුවන් විසින් වැරදීමකින් හෝ අතපසුවීමකින් බැර කර ඇති මුදල් ආපසු ගෙවීමට සිදුවන අවස්ථාවලදී හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ මාසික ගිණුම් ගැලපීමෙන් පසු අදාල පාර්ශවකරුවන්ට ගෙවීමට ප්‍රධාන ගණකාධිකාරී විසින් කටයුතු කළ යුතුය.

- හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කටයුතු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි ඉටුකරනු ලබන තැනැත්තා ඉටු කළ යුතුය.

- අභ්‍යන්තර විගණකගේ සහායට ඔහු විසින් නම් කරනු ලබන තවත් එක් නිලධාරියෙකු පත්කරගත යුතු අතර හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය මත එම පත්කිරීම් කළ යුතුය.

- හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම, වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ සියලු කටයුතු ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යයට ඇතුලත් විය යුතුය.

- 2023 වර්ෂයේ සිට හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කළමනාකරණ කමිටුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවට සමගාමීව පැවැත්විය යුතුය.

- විගණකාධිපතිගේ ගාස්තු අරමුදලේ පරිපාලන වියදම්වලින් ගෙවිය යුතුය.

# 03. ප්‍රගතිය

## 3.1 හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම

*උපලේඛන අංක -01*

**2022.12.31 දිනට හිමිකම් ආදායම**

| මාසය | 60% | 40%* | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 1,986,063.00 | 1,324,042.00 | 3,310,105.00 |
| පෙබරවාරි | 2,061,489.00 | 1,374,326.00 | 3,435,815.00 |
| මාර්තු | 2,415,720.00 | 1,610,480.00 | 4,026,200.00 |
| අප්‍රේල් | 1,637,877.00 | 1,091,918.00 | 2,729,795.00 |
| මැයි | 1,459,377.00 | 972,918.00 | 2,432,295.00 |
| ජූනි | 1,680,810.00 | 1,120,540.00 | 2,801,350.00 |
| ජූලි | 1,184,773.08 | 789,848.72 | 1,974,621.80 |
| අගෝස්තු | 2,064,876.00 | 1,376,584.00 | 3,441,460.00 |
| සැප්තැම්බර් | 2,037,630.00 | 1,358,420.00 | 3,396,050.00 |
| ඔක්තොම්බර් | 1,810,644.00 | 1,207,096.00 | 3,017,740.00 |
| නොවැම්බර් | 1,818,672.00 | 1,212,448.00 | 3,031,120.00 |
| දෙසැම්බර් | 1,689,379.20 | 1,126,252.80 | 2,815,632.00 |
| | 21,847,310.28 | 14,564,873.52 | 36,412,183.80 |

* හිමිකම් රක්ෂණ මුදලේ ආදායම

## 3.2 භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම



2022.12.31 දක්වා භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කිරීම

උපලේඛන අංක 03

| ISIN Code | Bill Number | Security Number | Value Date | Maturity Date | Face Value | Investment Value | Accrud Interest | Settlement value(cash bok) | Received Coupon 31.12.2022 | 2021.12.31 Bond Value | Amortization Income 31.12.2022 | Received Primium Year Of 2022 | Bond Value- 31.12.2022 | Recivable Interest- 31.12.2022 | Receved Bond Interest- 31.12.2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | A | B | C | D = B+C | E | E | F | G | H = B+F/ E+G | I | J |
| LKB00524C150 | TB/LN 24 | 1553934 | 17-May-19 | 15-Mar-24 | 7,800,300.00 | 7,954,823.94 | 145,553.60 | 8,100,377.54 | 850,232.70 | 7,878,856.82 | (110,553.65) | (34,586.53) | 7,844,270.29 | 251,310.07 | 598,922.63 |
| LKB00524F153 | TB/LN 25 | 1577676 | 19-Jul-19 | 15-Jun-24 | 3,564,300.00 | 3,631,861.31 | 33,939.26 | 3,665,800.57 | 365,340.76 | 3,602,063.76 | (44,247.22) | (14,451.67) | 3,587,612.28 | 16,057.17 | 349,283.59 |
| LKB00524F153 | TB/LN 26 | 1594154 | 30-Aug-19 | 15-Jun-24 | 4,692,000.00 | 4,752,076.37 | 99,864.53 | 4,851,940.90 | 480,930.00 | 4,726,580.04 | (38,770.00) | (13,273.67) | 4,713,306.37 | 21,137.46 | 459,792.54 |
| LKB00524F153 | TB/LN 27 | 1600659 | 17-Sep-19 | 15-Jun-24 | 2,295,300.00 | 2,294,565.50 | 60,423.78 | 2,354,989.28 | 235,268.24 | 2,295,300.00 | 734.00 | - | 2,295,300.00 | 10,340.33 | 224,927.92 |
| LKB00524F153 | TB/LN 28 | 1604964 | 27-Sep-19 | 15-Jun-24 | 3,061,700.00 | 3,066,362.97 | 89,175.07 | 3,155,538.04 | 313,824.24 | 3,064,642.29 | (2,948.42) | (1,227.74) | 3,063,414.55 | 13,792.96 | 300,031.30 |
| LKB00524F153 | TB/LN 29 | 1619522 | 4-Nov-19 | 15-Jun-24 | 15,437,600.00 | 15,602,272.88 | 613,922.48 | 16,216,195.36 | 1,582,354.00 | 15,534,826.01 | (104,836.74) | (37,389.87) | 15,497,436.14 | 69,546.39 | 1,512,807.61 |
| LKB00524F153 | TB/LN 30 | 1627223 | 25-Nov-19 | 15-Jun-24 | 4,733,800.00 | 4,862,085.98 | 216,093.24 | 5,078,179.22 | 485,214.50 | 4,809,531.33 | (81,492.37) | (28,936.72) | 4,780,594.61 | 21,325.77 | 465,327.81 |
| LKB00524F153 | TB/LN 31 | 1638380 | 20-Dec-19 | 15-Jun-24 | 9,254,200.00 | 9,375,615.10 | 12,955.88 | 9,388,570.98 | 948,555.50 | 9,339,329.38 | (76,920.91) | (27,679.31) | 9,311,650.07 | 41,690.17 | 906,864.83 |
| LKB00524I157 | TB/LN 32 | 1648325 | 17-Jan-20 | 15-Sep-24 | 2,300,000.00 | 2,322,330.70 | 77,176.50 | 2,399,507.20 | 226,550.00 | 2,313,852.90 | (13,415.90) | (4,938.10) | 2,308,914.80 | 66,964.50 | 150,199.20 |
| LKB00524I157 | TB/LN 33 | 1664671 | 28-Feb-20 | 15-Sep-24 | 3,045,200.00 | 3,072,430.18 | 136,790.38 | 3,209,220.56 | 299,952.20 | 3,062,113.04 | (16,367.95) | (6,050.81) | 3,056,062.23 | 88,661.00 | 198,864.73 |
| LKB00524I157 | TB/LN 34 | 1686910 | 8-Jun-20 | 15-Sep-24 | 10,508,600.00 | 11,024,162.42 | 239,081.16 | 11,263,243.58 | 1,035,097.10 | 10,855,173.62 | (289,091.59) | (120,102.28) | 10,735,071.34 | 305,957.89 | 686,253.61 |
| LKB00524I157 | TB/LN 35 | 1691667 | 23-Jun-20 | 15-Sep-24 | 2,565,000.00 | 2,828,068.97 | 68,654.79 | 2,896,723.76 | 252,652.50 | 2,741,784.93 | (148,036.41) | (61,751.39) | 2,680,033.54 | 74,679.98 | 167,504.75 |
| LKB01026H014 | TB/LN 36 | 1717468 | 15-Sep-20 | 1-Aug-26 | 3,506,000.00 | 4,350,567.35 | 49,304.88 | 4,399,872.23 | 403,190.00 | 4,191,317.82 | (292,098.88) | (132,849.35) | 4,058,468.47 | 166,535.00 | 236,655.00 |
| LKB00524I157 | TB/LN 37 | 1732755 | 10-Nov-20 | 15-Sep-24 | 2,160,900.00 | 2,426,764.17 | 32,927.79 | 2,459,691.96 | 212,848.64 | 2,353,912.65 | (140,523.33) | (67,676.31) | 2,286,236.34 | 62,914.60 | 140,816.64 |
| LKB00524I157 | TB/LN 38 | 1742871 | 15-Dec-20 | 15-Sep-24 | 2,658,700.00 | 2,964,322.88 | 65,832.07 | 3,030,154.95 | 261,881.96 | 2,886,141.25 | (158,009.20) | (79,827.47) | 2,806,313.78 | 77,408.05 | 173,623.76 |
| LKB00524I157 | TB/LN 39 | 1770277 | 16-Mar-21 | 15-Sep-24 | 4,800,400.00 | 5,296,305.32 | 1,286.51 | 5,297,591.83 | 472,839.40 | 5,192,501.47 | (241,268.10) | (137,464.25) | 5,055,037.22 | 139,763.65 | 313,485.32 |
| LKB00524I157 | TB/LN 40 | 1795992 | 16-Jun-21 | 15-Sep-24 | 2,531,400.00 | 2,771,736.18 | 63,014.14 | 2,834,750.32 | 249,342.90 | 2,734,914.44 | (108,143.94) | (71,322.20) | 2,663,592.24 | 73,701.71 | 165,310.55 |
| LKB00524I157 | TB/LN 41 | 1812025 | 6-Aug-21 | 15-Sep-24 | 5,548,100.00 | 6,030,535.04 | 213,840.42 | 6,244,375.46 | 546,487.84 | 5,972,829.25 | (206,389.32) | (148,683.63) | 5,824,145.52 | 161,532.93 | 362,312.59 |
| LKB00524I157 | TB/LN 42 | 1856528 | 22-Sep-21 | 15-Sep-24 | 3,001,900.00 | 3,158,638.20 | 5,718.62 | 3,164,356.82 | 295,687.16 | 3,150,704.18 | (63,361.10) | (49,708.36) | 3,095,277.10 | 87,400.32 | 196,036.09 |
| LKB00524I157 | TB/LN 43 | 1834912 | 15-Oct-21 | 15-Sep-24 | 3,809,600.00 | 3,851,875.13 | 31,097.76 | 3,882,972.89 | 375,245.60 | 3,879,772.83 | (16,887.96) | (13,630.76) | 3,835,044.31 | 110,916.50 | 264,329.10 |
| LKB00524I157 | TB/LN 44 | 1857149 | 15-Dec-21 | 1-Sep-23 | 8,257,200.00 | 8,306,792.74 | 215,554.21 | 8,522,346.95 | 743,148.00 | 8,521,273.51 | (30,394.75) | (29,321.31) | 8,276,397.99 | 248,401.35 | 494,746.65 |
| LKB00824H013 | TB/LN 45 | 1887889 | 15-Mar-22 | 1-Aug-24 | 8,174,800.00 | 7,632,034.15 | 104,326.80 | 7,736,360.95 | 449,614.00 | | 161,566.75 | 161,566.75 | 7,793,600.90 | 371,422.04 | 345,287.20 |
| LKB00628A153 | TB/LN 46 | 1915336 | 16-Jun-22 | 15-Jan-28 | 5,659,700.00 | 5,303,518.10 | 427,760.13 | 5,731,278.23 | 509,373.00 | | 21,648.35 | 21,648.35 | 5,325,166.45 | 467,847.78 | 81,612.87 |
| LKB00425F013 | TB/LN 47 | 1929480 | 2-Aug-22 | 1-Jun-25 | 2,470,500.00 | 2,171,473.15 | 71,145.46 | 2,242,618.61 | 209,992.50 | | 33,732.21 | 33,732.21 | 2,205,205.36 | 34,614.18 | 138,847.04 |
| LKB00425F013 | TB/LN 48 | 1944699 | 15-Sep-22 | 1-Jun-25 | 5,786,300.00 | 4,713,427.40 | 284,888.48 | 4,998,315.88 | 491,835.50 | | 86,482.04 | 86,482.04 | 4,799,909.44 | 81,071.85 | 206,947.02 |
| LKB00425F013 | TB/LN 49 | 1975436 | 15-Dec-22 | 1-Jun-25 | 8,119,500.00 | 6,481,528.91 | 53,085.29 | 6,534,614.20 | | | 17,578.72 | 17,578.72 | 6,552,192.92 | 60,673.19 | |
| | | | | | 152,577,600.00 | 152,889,772.89 | 3,761,826.63 | 156,651,599.52 | 12,297,458.24 | 109,107,421.52 | (1,862,015.67) | (759,863.65) | 134,450,254.27 | 3,125,666.84 | 9,140,790.35 |

## 3.3 කාර්ය සාධනය

2022 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම රු.15,000,000.00 ක් වූ අතර රක්ෂණ අරමුදලට බැරවූ සත්‍ය ආදායම රු.14,564,873.52 ක් විය. ඒ අනුව 2022 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ ආදායම, 2021 වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලට බැර වූ ආදායමට වඩා 11.13% කින් වර්ධනය වී තිබුණි.




හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් අංක 1616/23 හා 2009.08.24 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන අනුව කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් මත 2022 වර්ෂයේ රුපියල් මිලියන 13,786,037.46 ක නව ආයෝජනයක් සිදු කරන ලදී.

2022 වර්ෂයේ ඇස්තමේන්තුගත භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු.10,000,000.00 ක් වූ අතර සත්‍ය වශයෙන් ලද පොළී ආදායම රු. 11,680,777.59 ක් විය.




මෙම රක්ෂණ අරමුදල සඳහා අරමුදල් රැස් කරනු ලබන්නේ ලියාපදිංචි කර ඇති හිමිකම් සහතිකවලින් කරනු ලබන පසුගණුදෙනු ලියාපදිංචි කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු එකතු කිරීම තුළිනි. මේ දක්වා නිකුත් කර ඇති හිමිකම් සහතිකවලට අදාලව පසුගණුදෙනු සාධනපත්‍ර 53,089 ක් 2022 වර්ෂය තුළ ලියාපදිංචි කර සහතික නිකුත් කරන ලදී.

2021 වර්ෂයේදී හිමිකම් රක්ෂණ අරමුදලේ සමුච්චිත අරමුදල රු. 112,589,214.49 ක් වන අතර 2022 වර්ෂය අවසාන වන විට මෙහෙයුම් අතිරික්තය එකතු කිරීමෙන් පසුව මුළු සමුච්චිත අරමුදල රු.138,326,029.54 ක් වේ.

හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලය වර්ෂය තුල සිව්වරක් රැස්වූ අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2016 වර්ෂයේදී පත් කරන ලද හිමිකම් රක්ෂණ අරමුදලේ විගණන කළමනාකරණ කමිටුව මෙම වර්ෂයේදී එක්වරක් රැස්විය.

## 3.3 වන්දි ගෙවීම

අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළමුවන රෙගුලාසිය පරිදි මේ වන තෙක් අරමුදලෙන් ගෙවිය යුතු වන්දි පිළිබඳව කිසිදු අධිකරණ තීන්දුවක් ලැබී නොමැති බැවින් හිමිකම් රක්ෂණ අරමුදල මඟින් කිසිදු හානි පූර්ණ වන්දියක් ගෙවා නොමැත.

# 01. මූල්‍ය වාර්තා

## 4.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

රු.

| 2021.12.31 | | 2022.12.31 |
|---|---|---|
| | **වත්කම්** | |
| 474,282.43 | ආයෝජන - 01). රිපෝ බිල්පත් | |
| 109,107,421.52 | 02). භාණ්ඩාගාර බැඳුම්කර | 134,450,254.27 |
| 109,581,703.95 | | 134,450,254.27 |
| | **ජංගම වත්කම්** | |
| 2,016,880.04 | ලැබිය යුතු ආයෝජන පොළි | 3,125,666.84 |
| 1,557,030.50 | බැංකු ශේෂය | 1,046,508.43 |
| 0.52 | 2021 වර්ෂයේ ආදායම අඩුවෙන් සටහන්කිරීම ගැලපීම | |
| 3,573,911.06 | | 4,172,175.27 |
| **113,155,615.01** | **මුළු වත්කම්** | **138,622,429.54** |
| | **අඩු කළා : ජංගම වගකීම්** | |
| 296,400.00 | ගෙවිය යුතු විගණන ගාස්තු | 296,400.00 |
| 296,400.00 | | 296,400.00 |
| **112,859,215.01** | **ශුද්ධ වත්කම්** | **138,326,029.54** |
| 91,409,664.37 | සමුච්චිත අරමුදල | 112,859,215.01 |
| 21,449,550.64 | **එකතු කළා : මෙහෙයුම් අතිරික්තය** | 25,466,814.53 |
| **112,859,215.01** | **අරමුදල** | **138,326,029.54** |

ඉහත ගිණුම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිලියෙළ කර ඇති බවත් එම ගිණුම්වල නිවැරදි භාවය පිළිබඳ වගකීම දරන බවත් සහතික කරමි.

.....
පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්/ සභාපති
හිමිකම් රක්ෂණ අරමුදල

.....
එල්.ඒ.එස්.ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දිනය- 27/2

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, බෙස්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, බෙස්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

## 4.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

රු

| 2021.12.31 ට තත්‍ය ආදායම / වියදම | | 2022.12.31 ට තත්‍ය ආදායම / වියදම | 2022 ඇස්තමේන්තුගත ආදායම / වියදම | විචලනය % |
|---|---|---|---|---|
| | **අයභාරය** | | | |
| 13,105,683.60 | හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම | 14,564,873.52 | 14,000,000.00 | 4.03% |
| 0.52 | 2021 වර්ෂයේ ආදායම අඩුවෙන් සටහන් කිරීම ගැලපීම | | | |
| 9,335,331.90 | භාණ්ඩාගාර ආයෝජන පොළී ආදායම | 11,680,777.07 | 9,000,000.00 | 29.28% |
| **22,441,016.02** | මුළු අයභාරය | **26,245,650.59** | | |
| | **වියදම්** | | | |
| 90,000.00 | කළමනාකරණ කමිටු දීමනා | 138,000.00 | 432,000.00 | -68% |
| 18,000.00 | විගණන කළමනාකරණ කමිටු දීමනා | 24,000.00 | 96,000.00 | -75% |
| 579,849.76 | කාර්ය මණ්ඩල දීමනා | 591,642.06 | 610,000.00 | -3% |
| 9,615.62 | සංග්‍රහ වියදම් | 25,194.00 | 15,000.00 | 68% |
| 294,000.00 | විගණන ගාස්තු | | 400,000.00 | |
| - | ලිපි ද්‍රව්‍ය | | 2,500.00 | |
| **991,465.38** | මුළු වියදම් | **778,836.06** | | |
| **21,449,550.64** | කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය | **25,466,814.53** | | |

.....
පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්/ සභාපති
හිමිකම් රක්ෂණ අරමුදල
දිනය ....27/2.....

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, බෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බුත්තරමුල්ල.

.....
එල්.ඒ.එස්. ලියනආරච්චි

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, බෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බුත්තරමුල්ල.

2

## 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රු

| 2021.12.31 | | | 2022.12.31 | |
|---|---|---|---|---|
| | | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| | | **ලැබීම්** | | |
| 13,105,683.60 | | හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම | 14,564,873.52 | |
| 0.52 | | 2021 වර්ෂයේ ආදායම අඩුවෙන් සටහන්කිරීම ගැලපීම | | |
| 8,886,706.33 | | ආයෝජන වලින් ලද පොලිය | 10,571,990.27 | |
| | 21,992,390.45 | | | 25,136,863.79 |
| | | **ගෙවීම්** | | |
| 579,849.76 | | කාර්ය මණ්ඩල දීමනා | 591,642.06 | |
| 9,615.62 | | සංග්‍රහ වියදම් | 25,194.00 | |
| 90,000.00 | | කළමනාකරණ කමිටු දීමනා | 138,000.00 | |
| 18,000.00 | | විගණන කළමනාකරණ කමිටු දීමනා | 24,000.00 | |
| 585,600.00 | | විගණන ගාස්තු | - | |
| 8,017,000.00 | | | | |
| | (9,300,065.38) | | | (778,836.06) |
| | 12,692,325.07 | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 24,358,027.73 |
| | | **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | 109,581,703.95 |
| | 97,189,303.60 | කල් පිරුණු භාණ්ඩාගාර බිල්පත් | | |
| | 109,581,703.95 | ආයෝජන වල වටිනාකම | | 134,450,254.27 |
| | 12,392,400.35 | ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | (24,868,550.32) |
| | 299,924.72 | මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /අඩුවීම | | (510,522.59) |
| | 1,257,106.30 | කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | 1,557,031.02 |
| | **1,557,031.02** | කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | **1,046,508.43** |

.....
එල්.ඒ.එස්.ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙස්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

3

## 4.4 ලැබීම් හා ගෙවීම් ගිණුම

**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**ලැබීම් හා ගෙවීම් ගිණුම**

රු

| 2021.12.31 | | | 2022.12.31 |
|---|---|---|---|
| 1,257,106.30 | 2021.12.31 දිනට ශේෂය | | 1,557,031.02 |
| | **ලැබීම්** | | |
| 97,189,303.60 | ආයෝජන කල් පිරීම- භාණ්ඩාගාර බැඳුම්කර | | 109,107,421.52 |
| | ආයෝජන කල් පිරීම- රිපෝ බිල්පත් | | 474,282.43 |
| 13,105,683.60 | හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම | | 14,564,873.52 |
| 0.52 | 2021 වර්ෂයේ ආදායම අඩුවෙන් සටහන්කිරීම ගැලපීම | | |
| 28,624.40 | රිපෝ බිල්පත් ආයෝජනයෙන් ලද පොළිය | 174,887.14 | |
| 10,051,758.80 | භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් ලද පොළිය | 12,297,458.24 | |
| (426,205.81) | භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය (Premium) | (759,863.65) | |
| (767,471.06) | භාණ්ඩාගාර බැඳුම්කර පොලියෙන් ආපසු ගෙවන පොලිය | (1,140,491.46) | |
| 8,886,706.33 | | | 10,571,990.27 |
| 120,438,800.35 | **මූළු ලැබීම** | | 136,275,598.76 |
| | **ගෙවීම්** | | |
| 109,107,421.52 | භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 134,450,254.27 |
| 474,282.43 | රිපෝ බිල්පත් වල ආයෝජනය | | - |
| 90,000.00 | කළමනාකරණ මණ්ඩල කමිටු දීමනා | | 138,000.00 |
| 18,000.00 | විගණන කළමනාකරණ කමිටු දීමනා | | - |
| 579,849.76 | කාර්ය මණ්ඩල දීමනා | | 591,642.06 |
| 9,615.62 | සංග්‍රහ වියදම් | | 25,194.00 |
| 585,600.00 | විගණන ගාස්තු | | 24,000.00 |
| 8,017,000.00 | වැරදි නිවැරදි කිරීම් | | - |
| 118,881,769.33 | **මූළු ගෙවීම්** | | 135,229,090.33 |
| **1,557,031.02** | **2022.12.31 දිනට අවසන් ශේෂය** | | **1,046,508.43** |

එල්.ඒ.එස්.ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/3, ඩෙන්සිල් කොබෑකඩුව මාවත,
බත්තරමුල්ල.

## 4.5 ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය**

රු

| | පාලන අස්තිත්වයේ අයිතිකරුවන්ට අදාළ වන | | | | | සුලු කොටස් හිමි අයිතිය | මුලු ශුද්ධ වත්කම් /ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|
| | සහභාගී වූ ප්‍රාග්ධනය | වෙනත් සංචිත | පරිවර්ථන සංචිතය | සමුච්චිත ලාභ/(අලාභ) | මුලු එකතුව | | |
| 2022.01.01 දිනට ශේෂය | - | - | - | 112,859,215.01 | 112,859,215.01 | - | 112,859,215.01 |
| ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ වෙනස්වීම | - | - | - | - | - | - | - |
| නැවත ප්‍රකාශිත ශේෂය | - | - | - | - | - | | - |
| 2022 සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි වෙනස්වීම | - | - | - | - | - | - | - |
| දේපළ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | - | - | - | - | - | - | - |
| ආයෝජන ප්‍රත්‍යාගණනය මත අලාභ | - | - | - | - | - | - | - |
| විදේශ මෙහෙයුම් විනිමය පරිවර්ථන අලාභය | - | - | - | - | - | | - |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධයෙහි හඳුනාගන්නා ලද ශුද්ධ අයභාරයෙහි වර්ධනය | - | - | - | - | - | - | - |
| කාලපරිච්චේදය සඳහා වූ අතිරික්තය | - | - | - | 25,466,814.53 | 25,466,814.53 | - | 25,466,814.53 |
| කාලපරිච්චේදය සඳහා හඳුනාගත් මුලු ආදායම් සහ වියදම් | - | - | - | - | - | - | - |
| 2022.12.31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය | - | - | - | 138,326,029.54 | 138,326,029.54 | - | 138,326,029.54 |

## 4.6 ශේෂ පිරික්සුම

**හිමිකම් රක්ෂණ අරමුදල**
**2022.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**ශේෂ පිරික්සුම**

රු

| විස්තරය | හර | බැර |
|---|---|---|
| සමුච්චිත අරමුදල | - | 112,859,215.01 |
| රිපෝ බිල්පත් වල ආයෝජන ගිණුම | - | |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන ගිණුම | 134,450,254.27 | - |
| බැඳුම්කර වල පොළී ආදායම් ගිණුම | - | 12,266,457.19 |
| රිපෝ බිල්පත් වල පොළී ආදායම් ගිණුම | | 174,183.53 |
| භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය ( Premium ) | 759,863.65 | |
| හිමිකම් ලියාපදිංචිකිරීමේ ආදායම් ගිණුම | - | 14,564,873.52 |
| ලැබිය යුතු පොළී ගිණුම | 3,125,666.84 | - |
| කාර්ය මණ්ඩල දීමනා ගිණුම | 591,642.06 | - |
| සංග්‍රහ වියදම් දීමනා ගිණුම | 25,194.00 | - |
| කළමනාකරණ මණ්ඩල රැස්වීම් දීමනා ගිණුම | 138,000.00 | - |
| විගණන කළමනාකරණ කමිටු දීමනා | 24,000.00 | - |
| ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම | - | 296,400.00 |
| බැංකු ශේෂය | 1,046,508.43 | - |
| | **140,161,129.25** | **140,161,129.25** |

.....
එල්.ඒ.එස්.ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

එල්. ඒ. එස්. ලියනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/1/3, ඩෙස්සිල් කොඩිබෑකඩුව මාවත,
උත්තරමුල්ල.

## 4.7 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

සටහන්

මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන්

**01.** ආයතනික තොරතුරු

හිමිකම් ලියාපදිංචිය සඳහා ආරක්ෂිත ජාලයක් සැපයීමත් සහ හානියකට හෝ අලාභයකට මුහුණ දෙන පුද්ගලයන් හට අධිකරණ නියෝග මත වන්දි ගෙවීමත් පරමාර්ථ කොටගෙන 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වන වගන්තියට 2009 අගෝස්තු 21 දින ගෙන එන ලද සංශෝධනයට අනුකූලව මෙම අරමුදල ක්‍රියාත්මක වේ. හිමිකම් රක්ෂණ අරමුදලේ කාර්යාලය අංක 234/ඒ3, ඩෙන්සිල් කොඩිබෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයේ පිහිටා ඇත.

**02.** සැකසීමේ මූලධර්ම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ එහි සංශෝධන වලට අනුකූලව ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත.

**2.1** අනුකූලතා ප්‍රකාශය

හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශ රජයේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර ඇත.

**2.2** අඛණ්ඩතාව

හිමිකම් රක්ෂණ අරමුදල දිගටම පවත්වාගෙන යාමේ හැකියාව සහ එය විසුරුවා හැරීමට හෝ නවතා දැමීමට අදහස් නොකරන බවට එහි අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තහවුරු කර ඇත.

**03.** ආදායම

2022 වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ලද ආදායමෙන් 40% ක් අරමුදලට ප්‍රේෂණය කර ඇති අතර එම මුදල රු. 14,564,873.52 කි. *(උපලේඛන අංක -01)*

**04.** කාර්ය මණ්ඩල දීමනා

පරිපාලන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකු සඳහා කාර්ය මණ්ඩල දීමනා ගෙවා ඇත.

**05.** කළමනාකරණ කමිටු දීමනා

කළමනාකරණ මණ්ඩල සහ විගණන කලමනාකරණ කමිටු දීමනා සඳහා රුපියල් 162,000.00 ක් ගෙවීම් කර ඇත.

**06.** විගණන ගාස්තු

2021 වර්ෂයේදී ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රුපියල් 296,400.00 ක මුදලක් ගිණුම්වල ගලපා ඇතත් 2022 වර්ෂයේ විගණන ගාස්තු ගිණුම් වල ගලපා නැත.

**07.** ආයෝජන

2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර වල වටිනාකම රුපියල් 134,450,254.27 කි. (උපලේඛන අංක 03)

**08.** ආයෝජන මත පොළි

ලැබිය යුතු ආයෝජන පොලී

2022.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර (උපලේඛන 03I)
3,125,666.84

භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම

| | | |
|---|---|---|
| 2022.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලැබිය යුතු පොලිය (උපලේඛන 03) | | 3,125,666.84 |
| 2022.12.31 භාණ්ඩාගාර බැඳුම්කර පොලිය | (උපලේඛන 03J) | 9,140,790.87 |
| 2022.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොලිය | (උපලේඛන 02) | 174,183.53 |
| | | 12,440,641.24 |

ලැබුණු ආයෝජන පොලී

| | | |
|---|---|---|
| 2022.12.31 දිනට රිපෝ බිල්පත් වලින් ලැබුණු පොලිය | (උපලේඛන 02) | 174,887.15 |
| 2022.12.31 භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලැබුණු පොලිය | (උපලේඛන 03E ) | 12,297,458.24 |
| | | 12,472,345.39 |

# 01. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/G/RGD-TIF/FA/2022/01 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින

රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

හිමිකම් රක්ෂණ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ චෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හිමිකම් රක්ෂණ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල නැවැත් කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත්

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලින් බැහැරවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | |
| (i) අංක 42 (ආ) | හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02 කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය සඳහා එසේ ලබානොදුන් වාර්තා ගණන 141 කි. |

| | | |
|---|---|---|
| (ii) | අංක 42 (ඉ) | සෑම දින 14 ක් අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගන්නා මුදල් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වෙන් වශයෙන් හර කළ යුතු වුව ද, සියලු හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි දෛනික ආදායම්වල එකතුවක් සෑම දිනකම මුදල් පොතට හර කර නිබුණි. |
| (iii) | අංක 42 (උ) (4) | සෑම මාසයක අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ මුදල් පොතේ හෝ බැංකු ගිණුමේ කිසිම ශේෂයක් නොතිබිය යුතු වුව ද, 2022 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන්හි පිළිවෙලින් රු.605,070 ක් හා රු.92,198 ක් බැගින් මුදල් පොතේ අවසාන ශේෂයන් පැවතුණි. |
| (ආ) 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2019/(I) (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 02 ඡේදය | | කාර්තුවකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් හෝ පැවැත්විය යුතු වුව ද, 2022 වර්ෂයේදී එක් රැස්වීමක් පමණක් පවත්වා නිබුණි. |

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව හිමිකම් කාර්යාල 11 ක් විසින් එවන ලද වාර්තා පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවට අනුව හිමිකම් කාර්යාල 06 ක් විසින් ප්‍රධාන කාර්යාලයට එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව "ආර්.ජී.ටී/ලයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවුව ද, කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යටෝක්ත නියෝග අංක 42 (ඌ) ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබෙන වාර්තා ඇතුළත් කිරීමට ආකෘති අංක "ආර්.ජී.ටී./අයි.ඒෆ්. 02" අනුව රෙජිස්ටරයක් නඩත්තු කළ යුතු වුව ද, එම රෙජිස්ටරයද අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදලේ ජංගම ගිණුමට කරන ලද සෘජු බැරකිරීම් හිමිකම් කාර්යාලවලින් ලබාගන්නා ලද කොරතුරු මත සැසඳීම් කර වර්ෂයට අදාළ හිමිකම් ආදායම හඳුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

**3.3 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ඉ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී අයිතිය සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනීම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීම අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුව ද, අරමුදල ආරම්භ වූ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූරණ වන්දි මුදලක් ගෙවීමකර නොතිබුණි. එසේම හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීම් සිදුකර ඇති බවට විගණනයේදී නිරීක්ෂණ නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 12 ක් පැවැත්වීමට යෝජනාකර තිබුණද, 2022 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි.

**3.4 අයවැය ලේඛනමය පාලනය**

2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව මුළු ඇස්තමේන්තුගත ආදායම හා වියදම් පිළිවෙලින් රු.23,000,000 ක් හා රු.1,555,500 ක් වූ අතර 2022 වර්ෂයේදී රු.27,000,000 ක් හා රු.1,216,600 ක් ලෙස ඇස්තමේන්තුගත ආදායම හා වියදම් සංශෝධනය කර තිබුණු නමුත් අනුමත සංශෝධිත අයවැය ලේඛනයේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති